# 2023-02-27 වන දින පැවති ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ
# විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**මෙදින පෙ.ව.10.00 ට පමණ මහා සභා රැස්වීම ආරම්භ වූ අතර පහත නම් සඳහන් ගරු සභික මහත්ම මහත්මීන් සහභාගී විය.**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1. | ඩබ්ලිව්.එල්.රුවන් ලියනගේ මැතිතුමා | ගරු සභාපති (වැ.බ) |
| 2. | ආර්.ධනරත්න මැතිතුමා | සභික |
| 3. | අනුර ගාමිණී හෙට්ටිආරච්චි මැතිතුමා | සභික |
| 4. | එස්.කරුණාදාස මැතිතුමා | සභික |
| 5. | ජී.කේ.හරිස්චන්ද්‍ර මැතිතුමා | සභික |
| 6. | පී.ආරියවංශ මැතිතුමා | සභික |
| 7. | එච්.සුමිත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | සභික |
| 8. | චමිල් නිශාන්ත දිසානායක මැතිතුමා | සභික |
| 9. | ජී.එම්.දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා | සභික |
| 10. | කේ.ගයානි ප්‍රියදර්ශනී කුමාරගේ මැතිණිය | සභික |
| 11. | එස්.එල්.ඩී.ශිරාන් සමරතුංග මැතිතුමා | සභික |
| 12. | සුනේත්‍රා රංජනී කරුණාරත්න මැතිනිය | සභික |
| 13. | රසිකා වසන්ති සිරිවර්ධන මැතිණිය | සභික |
| 14. | සනත් ප්‍රියන්ත සිරිසේන මැතිතුමා | සභික |
| 15. | රේවතී නන්දා මැතිණිය | සභික |
| 16. | ඩබ්.වී.ඩබ්. ජේමචන්ද්‍ර මැතිතුමා | සභික |
| 17. | එච්.ටී.තිලකරත්න මැතිතුමා | සභික |

නොපැමිණි,

| | | |
|---|---|---|
| 1. | ඩබ්ලිව්. අශෝක ගුණරත්න මැතිතුමා | සභික |
| 2. | ජී.එච්.සුජීව විජේසූරිය මැතිතුමා | සභික |
| 3. | කුමුදු නිල්මිණී රේණුකා මැතිනිය | සභික |
| 4. | මොහොමඩ් රාෆි මැතිතුමා | සභික |
| 5. | ආර්.ඒ.නන්දසේන මැතිතුමා | සභික |
| 6. | එම්.ඒ.වානක විජේරත්න මැතිතුමා | සභික |
| 7. | එස්.එම්.සේනාධීර මැතිණිය | සභික |
| 8. | ඩබ්ලිව්. තිලක් පුෂ්ප කුමාර මැතිතුමා | සභික |
| 9. | **සුගත් හෙන්ඩ්‍රි හැන්ඩ්‍රිෂන් මැතිතුමා** | සභික |
| 10. | යූ.එල් නුවන් මහේෂ් රත්නායක මැතිතුමා | සභික |
| 11. | කේ.ඒ.එන්.එන්. කස්තුරිආරච්චි මැතිණිය | සභික |
| 12. | මනෝජ් ප්‍රසාද් වෙලගෙදර මැතිතුමා | සභික |
| 13. | රසිකා අරුණකාන්ති මැතිනිය | සභික |

**01. ටී.ආර්.සී.කේ.ගුණසේකර මයා - ලේකම්**

ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ විය.

**සභාපතිතුමා :-**

**2022-12-31 දිනට අවසන් ගිණුම් වාර්තාව සභා සම්මත කර දෙන ලෙස යෝජනා කරනවා.**

**සභික පී.ආරියවංශ මැතිතුමා:-**

**එම යෝජනාව මම ස්ථිර කරනවා**

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**

**වැරදි අඩුපාඩු නැහැ නේද?**

**සභාපතිතුමා:-**

**අඩු පාඩු තිබෙනම් පෙන්වා දෙන්න**

**සභික තිලක් හොරගොඩ මැතිතුමා:-**

**මෙයට අනුමැතිය ලබාදීම පිළිබඳ අපට ගැටළුවක් නැහැ. නමුත් මෙය කිසිඳු තේරුමක් නැති වැඩක් ලෙස දකිනවා. මක් නිසාද යත් මෙය බැලීමෙන් අපට කිසිඳු තීරණයක් ගැනීමට බැහැ. මෙය අධ්‍යනය කිරීමට කාලයකුත් නැහැ. මෙම සටහන්ද සමඟ මූලා ප්‍රකාශ කට්ටලය කල් ඇතුව ලබාදී තිබුණා නම් හොඳයි. ලේකම්තුමාත් සඳහන් කළේ ජනවාරි 31 වන විට භාණ්ඩ සමීක්ෂණය අවසන්කර මාර්තු 01 වන විට මෙය**

පළාත් පාලන දෙපාර්තමේන්තුවට යැවිය යුතු බවයි. එම නිසා අප මේ පිළිබඳ ඉහළ නිලධාරීන් දැනුවත් කල යුතුයි මේවා කඩිනමින් සිදුකල හැකි දේවල් නොවන බවට.

**සභාපතිතුමා:-**

**එම අදහස ඉදිරිපත් කිරීම හොඳයි**

**සභික පී.ආරියවංශ මැතිතුමා:-**

**ජංගම නොවන වගකීම් ගිය වසරට වඩා මෙම වසරේ 620,546.80කින් අඩු වී තිබෙනවා. එයට හේතුව ලෙස මම විශ්වාස කරනවා භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කළ භාණ්ඩ හා බහු කාර්ය ගොඩනැගිල්ලට ලබාගත් ණය විය හැකියි මෙලෙස අඩුවී තිබෙන්නේ. නොමැති නම් අපේ ස්ථිර වත්කම් අපි විකුණා නැහැ.**

**තිලක් හොරගොඩ මැතිතුමා:-**

**ගැටහැත්ත බහුකාර්ය ගොඩනැගිල්ලේ ණය අප ගෙවන විට අඩු වෙනවා.**

**සභාපතිතුමා:-**

**මේ පිළිබඳව වැඩිදුර දැනගැනීම සඳහා විෂය භාර නිලධාරී මහත්මිය ගෙන්වීමට මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීමට මම යෝජනා කරනවා.**

**සභික රසිකා වසන්ති සිරිවර්ධන මැතිනිය:-**

**එම යෝජනාව මම ස්ථිර කරනවා**

**ඒ අනුව මහා සභාව කාරක සභාවක් බවට පත් විය.**

**සභාපතිතුමා:-**

**කාරක සභාව මහා සභාවක් ලෙස යෝජනා කරනවා.**

**සභික රසිකා වසන්ති සිරිවර්ධන මැතිනිය:-**

එම යෝජනාව මම ස්ථිර කරනවා

**කාරක සභාවේ කරුණු සාකච්ඡා කිරීමෙන් අනතුරුව කාරක සභාව මහා සභාවක් බවට පත් විය.**

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.

නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි ආර්ථික අපහසුතා ඇති පාසල් දරුවන්ට පාසල් පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය ලබාදීම සඳහා වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**සභාපතිතුමා:-**

**යම් යම් අඩුපාඩු තිබුණා. එම අඩුපාඩු නිසි ලෙස අධ්‍යානය කර ගැනීමට තිබුණු කාල වේලාව අනුව යම් යම් අඩුපාඩුකම් සිදුවී තිබෙනවා. එම අඩුපාඩු පෙන්වා දෙමින් ඒවා නිවැරදි කර ඉදිරියට යාමට අදහස් ඉදිරිපත් කරමින් මැදිහත්වූ සියලුම මන්ත්‍රීතුමන්ලාට මම ස්තුතිවන්ත වෙනවා. මේ සම්බන්ධව දැනුමක් තිබෙන, තිලක් හොරගොඩ මන්ත්‍රීතුමා,දිලීන් කරුණාපාල මන්ත්‍රීතුමා, පී.ආරියවංශ මන්ත්‍රීතුමා වැනි අයගෙන් ලැබෙන උපදෙස් මම අගය කරනවා. අනෙක් සියලුම දෙනාමත් මේ සම්බන්ධව අවධානයෙන් සිටිනවා. හදිසියේම සභා සම්මත කරනවාට වඩා සභාවේ ගෞරවයත් රැකගෙන කටයුතු කිරීම මම අගය කරනවා.පෙන්වා දුන් අඩුපාඩු නිසි ලෙස සකස්කර සම්මත වූ වාර්තාව නිසි ලෙස පළාත් සභාවට යැවීමට කටයුතු කරනවා. නැවතත් ඔබට වේලාව තිබේනම් මෙය අධ්‍යානය කරන ලෙස ඉල්ලා සිටිනවා.ලේකම්තුමා ඇතුළු වාර්තා කරන නිලධාරී දෙපලටත් ස්තුතිවන්ත වෙමින්,මෙම විශේෂ මහා** සභා රැස්වීම මින් නිමා කරනවා. දැන් වේලාව පෙ.ව.11.05 යි.

රුවන් ලියනගේ,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව